**වත්තල ප්‍රාදේශීය සභාව - 2021**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------------**

1.1. **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

වත්තල ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.78,408,018 ක් පෙර වර්ෂයේ අදායම ලෙස ගිණුම්ගත කර තිබීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ජ'නල් සටහන් අංක 35 මගින් රු.77,775,140 ක් ගිණුම්ගත කර තිබුණු බැවින් රු.632,878 කින් ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය අඩුවෙන් සහ සමුච්චිත අරමුදල වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ නිවැරදි කර ඇත. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී නිවැරදි කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් නොවුවද, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් හඳුනා ගැනීමේදී, අතිරික්තයේ /ඌනතාවයේ හඳුනා ගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම රු.7,777,514 ක් අඩු කර දැක්විය යුතු වුවත්, එකතුකර දක්වා තිබීම හේතුවෙන් වසර සඳහා විස්තීර්ණ ආදායම රු.15,555,028 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදිව සැකසීමට කටයුතු කරමි. | 2022 වර්ෂයේ වෙනත් විස්තීර්ණ ආදායම් හඳුනා ගැනීමේදී අතිරික්තයේ /ඌනතාවයේ හඳුනා ගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම අඩු කර දැක්විය යුතුය. |
| (ඇ) | ඉඩම මිලදී ගැනීමට මුද්දර ගාස්තු හා නීතිඥ ගාස්තු ලෙස රු.311,500 ක් ඉඩමේ වටිනාකමට එකතුකර ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගනිමි. 2022 අගෝස්තු 15 දින වන විට, දරන ලද මුද්දර ගාස්තු හා නීතිඥ ගාස්තුව ඉඩමේ වටිනාකම ප්‍රාග්ධනිත කර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇත. | මුද්දර ගාස්තු හා නීතිඥ ගාස්තු ඉඩමේ වටිනාකමට එකතුකර ප්‍රාග්ධනිත කළ යුතුය. |

1.6.2. **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයන් 21 කට අදාල 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.517,234,895ක් හා උපයෝගී ලේඛන අනුව ශේෂය රු.520,123,753 ක් වූයෙන් රු.2,888,858 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම්19 කට අදාලව වෙනස්කම් නිවැරදි කර ඇත. (වරිපනම් හා ගබඩා තොග ශේෂ හැර) 2022 අවසාන ගිණුම සමඟ උපලේඛන ඉදිරිපත් කරමි. | ගිණුම් වාර්තා ඊට අදාල ලේඛන හා උප ලේඛන සමග සසදා නිවැරදි ශේෂ පවත්වා ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂය, මූල්‍ය ප්‍රකාශනය අනුව රු.221,002,530 ක් සහ කාලවිශ්ලේෂණය අනුව රු.225,054,010 ක් වූයෙන්, රු.4,051,480 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. | ගිණුම් වාර්තා ඊට අදාල ලේඛන හා උප ලේඛන සමග සසදා නිවැරදි ශේෂ පවත්වා ගැනීම කළයුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය කාලවිශ්ලේෂණය අනුව රු.161,930,302 ක් සහ මූල්‍ය ප්‍රකාශනය අනුව රු.161,735,502 ක් වූයෙන් රු.194,800 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. | ගිණුම් වාර්තා ඊට අදාල ලේඛන හා උප ලේඛන සමග සසදා නිවැරදි ශේෂ පවත්වා ගැනීමට කටයුතු කළයුතුය. |

1.6.3. **ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම්**

| | විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාලවිශ්ලේෂණය අනුව වසර 01 ට අඩු, වසර 1 ත් 3 ත් අතර, වසර 3 ත් 5 ත් අතර, වසර 5 ත් 10 ත් අතර හා වසර 10 ට වැඩි ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු.121,883,529 ක්, රු.42,232,915 ක්, රු.19,976,997 ක් රු.23,831,721 ක් හා රු.17,128,848 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | පිළිගනිමි. | ලැබිය යුතු ගිණුම් ශේෂ පරීක්ෂා කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | එකතු කල අදායම බදු අදායමට වඩා වියදම වැඩි වීම මත වැට් බදු ගිණුමේ රු.1,261,013 ක හර ශේෂයක් ආපසු ගෙවිය යුතු තැන්පත් යටතේ 2020 වර්ෂයේ සිට දක්වා | පිළිගනිමි. | එකතුකළ අගය මත බදු ශේෂය නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. 2021 වර්ෂය වනවිට එකතු කල අදායම බදු වලින් පළාත් පාලන ආයතන නිදහස් කර තිබුණද, එම ශේෂය නිරවුල් කරගෙන නොතිබුණි. | | |
| (ඇ) | කාල විශ්ලේෂණය අනුව වසර 1 ට අඩු, වසර 1 ත් 3 ත් අතර, වසර 3 ත් 5 ත් අතර වසර 5 ත් 10 ත් අතර සහ වසර 10 ට වැඩි ගෙවිය යුතු ශේෂ පිළිවෙලින් රු.125,671,979 ක්, රු.33,836,675 ක්, රු.1,406,521 ක්, රු.260,408 ක් හා රු.689,945 ක් 2022 අගෝස්තු 22 දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | ගෙවිය යුතු ශේෂ ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 1.7. **අනුකූල නොවීම්**

---------------------

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| 2016 අප්‍රේල් 28 දිනැති අංක LGD/04/2016 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ ඊ ඡේදය | 140,000,000 | ස්ථාවර තැන්පතු මුදල් කිරීම සඳහා දිස්ත්‍රික් සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගතයුතු වුවත් ඊට පටහැනිව 2018 වර්ෂයේදී රු.මිලියන 80 ක් සහ 2020 වර්ෂයේදී රු.මිලියන 60 ක් ලෙස ස්ථාවර තැන්පත් මුදල් කරගෙන තිබුණ අතර 2019 මාර්තු 26 දිනැති සභා තීරණය අනුව ස්ථාවර තැන්පත් මුදල් කරගැනීමේ මූලික අරමුණ වෙළඳ සංකීර්ණය හා ආදාහනාගාරය ඉදිකිරීම වුවත් ඒ සඳහා වැය නොකර සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා වැයකර තිබුණි. | ඉදිරියේ දී ස්ථාවර තැන්පත් මුදල් කර ගැනීමේ දී පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර තැන්පත් මුදල් කර ගැනීමේ දී නිසි අනුමැතිය ලබාගැනීමටද, අරමුණුගත කාර්යයන් සඳහා මුදල් යෙදවීමටද, කටයුතුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.120,504,997 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.257,160,854 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | කාල විශ්ලේෂණ වාර්තාව අනුව වසර 1 ට අඩු, වසර 1 ත් 3 ත් අතර, වසර 3 ත් 5 ත් අතර, වසර 5 ත් 10 ත් අතර හා වසර 10 ට වැඩි ලෙස පිළිවෙලින් රු.13,352,937 ක්, රු.22,103,096 ක්රු.19,284,014 ක්, රු.21,746,205 ක් සහ රු.12,887,412 ක් ලෙස පැවති අතර, හිඟ වරිපනම් අයකරගැනීමට දේපළ තහනම් කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගනිමි. 2021 වර්ෂයේ රට තුල පැවති වසංගත තත්වය හේතුවෙන් දේපල තහනම් කිරීම් සිදුකිරීමට හැකියාව නොතිබිණි. | හිග වරිපනම් ශේෂ විශ්ලේෂණය කර, සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර, හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කඩ කුලී | | |
| | (i) හිඟ හිටි ආදායම් කාල විශ්ලේෂණ වාර්තාව අනුව, 2021 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලීන කඩ කුලී ශේෂය රු.8,371,899 ක් තුල වසර 1 ට අඩු, වසර 1ත් 3ත් අතර, වසර 3 ත් 5ත් අතර, වසර 5 ත් 10 ත් අතර සහ වසර 10 ට වැඩි ශේෂ පිළිවෙලින් රු.2,260,737 ක්, රු.813,524 ක්, රු.437,716 ක්, රු.1,994,391 ක් හා රු.2,865,531 ක් ව තිබුණු බව නිරීක්ෂණය විය. මෙම හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | පිළිගනිමි. | හිඟ කඩකුලී ශේෂ විශ්ලේෂණය කර සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ii) හැඳල උප කාර්යාලයේ කඩ කාමර 8 ක ගිවිසුම් කාලය අවසන් වී ඇතත්, නැවත ගිවිසුම්ගත වී නොතිබුණ බැවින්, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් සිදුකර නොතිබුණි. තවද මෙම කඩ කාමර සඳහා 2021 ජනවාරි 01 දිනට රු.1,974,178 ක් වූ හිඟ කඩ කාමර කුලිය අයකරගැනීමට 2022 ජූලි 12 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | කඩ කාමර තවදුරටත් පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කර, කඩකුලී තක්සේරුවක් මත නැවත ගිවිසුම්ගතවී, වාර්ෂික බිල් කිරීම් සිදු කර, මාසික කඩ කුලිය සහ හිග කඩ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) බදු කුලී

---------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර 06 කට අදාලව බදු කුලී රු.366,249 ක් අයකර ගෙන නොතිබුණි. | පිළිගනිමි. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-------------------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | දික්ඕවිට අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා සභාවේ ඉඩමක් ලබාදීම | | |
| (අ) | දික්ඕවිට අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීම වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2011 මැයි දක්වා පෞද්ගලික ආයතනයකින් රු.525,000 ක්ද, 2011 ජූලි 01 සිට 2021 අප්‍රේල් 01 දක්වා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් රු.2,925,000 ක්ද අයවිය යුතුව පැවති අතර මෙම මුදල ගිණුම්ගත කරද නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් ගිවිසුම් අවලංගු කර නැවත ඉඩම ලබා දෙන ලෙස දැනුවත් කර ඇත. බර්න්ස් ආයතනය මගින් හිඟ මුදල නොගෙවීම සම්බන්ධව කිහිපවිටක් දැනුවත් කර ඇති බවත්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බවත් දන්වමි. | හිඟ මුදල අයකර ගැනීමටත්, හිඟ අදායම් ගිණුම්ගත කිරීමටත්, කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)(ආ) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයට අයත් මංමාවත් සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර, නාම ලේඛනයක් ගැසට්පත්‍රයක් මගින් පලකර, සියළු මාර්ග සභා අයිතියට පවරා ගතයුතු වුවද, සභාව සතු මාර්ග 1909 ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේදී මං මාවත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර අදාල නාම ලේඛනය ගැසට් පත්‍රය මඟින් පළකර සභා අයිතියට පවරා ගැනීමට කටයුතු කරමි. | පනත අනුව සභා බල ප්‍රදේශයට අයත් මාර්ග සභා අයිතියට පවරාගත යුතුය. |
| (ඇ) | වැලිසර උප කාර්යාලය 2021 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර සමීක්ෂණය සිදුකර බලපත්‍ර ලබා ගත යුතු ආයතන 34 ක් හඳුනාගෙන තිබුණද, වර්ෂය තුලදී පරිසර බලපත්‍ර නිකුත්කර නොතිබුණි. තවද හැඳල හා පමුණුගම උප කාර්යාල පරිසර බලපත්‍ර සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් වසංගතය හේතුවෙන් වරින් වර රට වසා තැබීමත්, ව්‍යාපාරික ස්ථාන වසා තිබීමත් හේතුවෙන් එම වසර තුළ නව පරිසර බලපත්‍ර ලබා ගැනීමට නොපැමිණීම. | සමීක්ෂණය මගින් හඳුනාගත් ආයතනවලින් ආදායම් අයකර ගැනීමටත්, නව සමීක්ෂණන් සිදු කර ආයතන හඳුනාගෙන, බලපත්‍ර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනත ප්‍රකාරව වසර 05 කට වරක් වරිපනම් තක්සේරු කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දේපල 58,003 ක් 2008 වර්ෂයේ සිදුකරන ලද වරිපනම් තක්සේරුවක් පදනම් කරගෙන බිල් කිරීම් සිදුකර තිබුණි. | පිළිගනිමි. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී නව තක්සේරුවක් සිදුකිරීමට 2020 වර්ෂයේ සිට දේපල තොරතුරු රැස්කිරීම සිදුකරමින් පවතී. ඉඩම් අනුබෙදුම් කිරීමේ දී හා අළුතින් ඉදිකරන ලද නිවාස සඳහා අනුකූලතා සහතික ලබාගැනීමේ දී ආදායම් පරීක්ෂක මගින් අදාල දේපල තක්සේරු කර නව වරිපනම් අංක ලබා දී වරිපනම් අයකිරීමට කටයුතු කරමි. | පනත අනුව කටයුතු කර නව වරිපනම් බදු රේටයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2. නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------------- | ------------ |
| ලියාපදිංචි හිමිකාරීත්වය මුදල් අමාතාංශය සතු බැවින්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති සහ වටිනාකම හඳුනාගත නොහැකි ගර්හිත තත්ත්වයෙන් වැලිසර වාහන අංගනයේ දිරා යමින් පැවති කැබ් රථය අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ හිමිකාරීත්වය පවරාගෙන විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතුකර නොතිබුණි. | කැබ්රථය අළුත්වැඩියා කළ නොහැකි බැවින්ද, ලියාපදිංචි හිමිකාරත්වය මුදල් අමාත්‍යාංශය සතු බැවින්ද, අදාල කැබ්රථයේ හිමිකාරීත්වය පවරාගෙන විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කරමි. | හිමිකාරීත්වය පවරාගෙන, අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කල යුතුය. |

**3.3. වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**<br><br>සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ඉඩම් 160 ක් පැවති අතර, ඉන් ඉඩම් 82 කට ඔප්පු නොපැවතුණි. | මේ වන විට ප්‍රකාශණ ඔප්පු හා පිඹුරුපත් සකස් කිරීමට ටෙන්ඩර් පිරිනමා ඇත. | ඔප්පු සකස් කර වත්කම් වල ආරක්ෂාව තහවුරු කරගත යුතුය. |
| (ආ) | **වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**<br><br>රූඩ් 2 පර්චස් 11 ක විශාලත්වයෙන් යුත් හැඳල සෝ සාතක ස්ථානය පිහිටි ඉඩමේ 2014 වර්ෂයේ පළාත් සභා අරමුදලින් රු.මිලියන 02 ක් වැය කරමින් ගොඩනැගිල්ලක් හා බස් නැවතුම්පල ඉදිකර තිබුණි. එම ස්ථානය පුද්ගලික බස් හා රථවාහන නවාතැන්පලක් සඳහා ගාස්තුවක් අය කිරීමකින් තොරව භාවිතා කිරීමට ඉඩ දී තිබුණි. 2021 පෙබරවාරි 22 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු ලිපිය අනුව, බදු පදනම මත මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ලබා දිය යුතු වාර්ෂික බදු කුලී වටිනාකම රු.976,000 ක් බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතුකර නොතිබීම හේතුවෙන් සභාවට රැස්කරගත හැකිව තිබූ ආදායමක් අහිමිවී තිබුණි. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සමඟ රජයේ තක්සේරු මුදලට ගිවිසුම්ගත වීමට දැනුම් දී ඇත. පවතින ආර්ථික අර්බුදය හමුවේ මෙපමණ මුදලක් ගෙවීමට නොහැකි බවත්, අමාත්‍යාංශය සමඟ සාකච්ඡාකර පිළිතුරක් ලබා දෙන බවත් දැනුම් දී ඇත. ගිවිසුම් ගත වී තක්සේරු වටිනාකම ගෙවන ලෙසත්, නැතිනම් ඉඩම අප වෙත ලබාදෙන ලෙසත්, දැනුම් දී ඇත. | සභාව සතු ආදායම් උපයාගතහැකි වත්කම්වලින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) පවරා නොගත් වත්කම්

----------------------------

| | | |
|---|---|---|
| 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුල සභාවේ පරිහරනය සඳහා වෙනත් රාජ්‍ය ආයතනවලින් සභාවට ලැබී තිබූ වටිනාකම රු.41,144,290 ක් වූ වාහන 2022 ජූලි මස වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි. | පවරාගැනීමට අදාල ලිපිලේඛන මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. | සභාව විසින් භාවිතා කරන වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) වත්කම් අන්සතු කිරීම

--------------------------

| | | |
|---|---|---|
| 1988 වර්ෂයේදී ආචාර්ය නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් විසින් තෑගි ඔප්පුවක් මගින් රු.188,000 ක වටිනාකමින් යුක්ත වූ අක්කර 11 රූඩ් 02 පර්චස් 11 ක් විශාලත්වයෙන් යුත් උස්වැටකෙයියාව පාර්ස් වත්ත ඉඩම, වත්තල ප්‍රාදේශීය සභාවට පිරිනමා තිබුණි. 1991 වර්ෂයේදී සභාපති හා ලේකම් විසින් මෙම ඉඩම ඉඩම් කොටස් 57 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවකට බෙදා තෑගි ඔප්පු මගින් අන්සතුකර තිබුණි. | උස්වැටකෙයියාව පාරිස් වත්ත ඉඩමේ ඔප්පු සකස් කල නීතිඥ මිය වෙත මේ පිළිබදව පැහැදිලි කිරීමක් ලබා ගැනීමට යොමුකර ඇත. | ඉඩම් පැවරීමේ ඔප්පුවේ සඳහන් අරමුණු අනුව කටයුතු කළයුතුය. |

## 3.4. ප්‍රසම්පාදන කළමනාකරණය

--------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව මිලදීගැනීම් සිදු කළ යුතුය. |
| (ආ) | සභාවේ නිලධාරීන් හා සේවකයින් සඳහා ටී ෂර්ට් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවා තිබූ මුදලින් රු.87,395 ක් වටිනාකම වූ ටී ෂර්ට් 113 ක් ලැබී නොතිබුණ අතර, සභාවට සිදුවූ අලාභය අයකරගෙන නොතිබුණි. . | පිළිගනිමි. මෙම මුදල දින 30 ක් තුල ගෙවීමට වත්තල පොලිසියේදී සැපයුම්කරු එකග වී ඇත. | අලාභය සැපයුම්කරුවන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකරගත යුතුය. |

## 3.5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු** | | |
| 2021 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩල සංඛ්‍යාවේ පුරප්පාඩු 45 ක් පැවතුණි. | පුරප්පාඩු පිළිබඳ වාර්ෂික කාර්තු වාර්තා මගින්ද, ලිපි මගින්ද අදාළ සේවකයින් හා නිළධාරින් ලබා දෙන මෙන් ඉල්ලීම් කර ඇත. නමුත් පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ අයවීම් හිඟ හිටි සේවක ණය ශේෂය විශ්‍රාම ගොස් තිබූ නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.381,900 ක්ද, මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.409,698 ක්ද, සේවය හැරගොස් තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.354,810 ක්ද, වෙනත් හේතු මත නිලධාරීන් 14 දෙනෙකුගෙන් රු.146,030 ක් ලෙස එකතු වටිනාකම රු.1,292,438 ක් 2022 ජූලි 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | සේවක ණය ශේෂය, ඇපකරුවන්ගෙන්, විශ්‍රාම පාරිතෝෂිකයෙන්, මරණ පාරිතෝෂිකයෙන් සහ වගකිවයුතු නිලධාරින්ගෙන් අයකරගැනීමට කටයුතුකල යුතුය. |

## 3.6. තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019-2023 දක්වා තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්මක් සකස්කර තිබුණද, තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම වෙනුවෙන්, ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන, දිගුකාලීන සැලසුම් කිසිවක්, 2021 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2021 වර්ෂයේ රට තුල පැවති වසංගත තත්ත්වය හේතුවෙන් අදාල සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | තිරසාර සංවර්ධනය සඳහා සකස්කර ඇති වාර්ෂික සැළසුම් ක්‍රියාත්මක කළ යුතුය. |